**ශීර්ෂය - 317 - උතුරු මැද පළාත් සභාව - 2024**

---------------------------------------------------

## 01. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

### 1.1 දැක්ම

සංවර්ධනයේ ප්‍රතිලාභ මැනවින් හිමිකරගත් අභිමානවත් ජනතාවකගෙන් පිරිපුන් පළාතක් රටට දයාද කිරීම.

### 1.2 මෙහෙවර

සියළුම පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන්, පළාතේ පවතින සියළුම සම්පත්වල හා විභවතාවන්ගෙන් ප්‍රශස්ථ උපයෝජනයෙන්, පළාතේ මානව සම්පත් සංවර්ධනය ප්‍රමුඛ කරගත් ආර්ථික සංවර්ධන ප්‍රවේශයකින් විනිවිදභාවයෙන් යුතුව පළාත සංවර්ධනය කරමින් ජාතික සංවර්ධනයට සෘජු හා අඛණ්ඩ ලෙස දායකවීම.

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

## 02. මූල්‍ය ප්‍රකාශන

**(අ) මුළු ප්‍රතිපාදන හා වියදම**

2024 වර්ෂයේදී උතුරු මැද පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රුපියල් මිලියන 35,740.4 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රුපියල් මිලියන 32,208.9ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව උතුරු මැද පළාත් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිකර තිබුණු මුදල රුපියල් මිලියන 3,531.5 ක් වූ අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදම | 2024.12.31 දිනට<br>ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | (රු.මි) | (රු.මි) | (රු.මි) | % |
| පුනරාවර්තන | 31,323 .4 | 29,140.7 | 2,182.7 | 7 |
| මූලධන | 4,417.0 | 3,068.2 | 1,348.8 | 30 |
| එකතුව | 35,740.4 | 32,208.9 | 3,531.5 | 10 |

## 03. විගණන නිරීක්ෂණ

(අ) වැය විෂය අංක 1507 පළාත් සභා සඳහා ප්‍රතිපාදනයන් යටතේ රුපියල් මිලියන. 1,677.4 ක පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයේදී එම සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම වියදම් නොකර ඉතිරි කර තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) වැය විෂය අංක 2203 පළාත් සභා සඳහා ප්‍රදානයන් යටතේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන මුදල ප්‍රධාන ලෙජරය අනුව රුපියල් මිලියන 1,848.4 ක් වුවත් අක්මුදල් නිදහස් කිරීමේ ලේඛනය අනුව ලබා දී තිබූ ප්‍රතිපාදන මුදල රුපියල් මිලියන 1,900.4 ක් වූයෙන් රුපියල් මිලියන 52 වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 317 ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන වලින් ලද අග්‍රිමය පළාත් සභාව විසින් පලාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගතකර උපයෝජනය කර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳව විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.